ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2022 පෙබරවාරි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, February 2022

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුය :**
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දි ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දි ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.


01. ව්‍යාපාර වලින් ඉටුවන ප්‍රධාන කාර්යය වන්නේ,
1. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය යි.
2. භාණ්ඩ හා සේවා බෙදාහැරීමයි.
3. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම යි.
4. ලාභ ලැබෙන කාර්යයක නිරතවීමයි.

02. භාණ්ඩ හා සේවා අතර වෙනස හඳුනා ගත හැක්කේ පහත දැක්වෙන කුමන සාධකය මත ද?
01. මිල මතය
02. ප්‍රමාණය මත ය
03. පැවැත්ම මතය
4. ස්පෘශ්‍යතාවය මතය.

03. ලංකාවේ ව්‍යාපාර කටයුතු සඳහා දේශපාලන පරිසරය ද බලපායි. පහත ප්‍රකාශ වලින් ගැලපෙන ශපාලන පරිසරයට අයත් නොවන ප්‍රකාශය තෝරන්න.
01. රජයේ ආයතන පෞද්ගලීකරණය කිරීම
02. විදේශීය ආයෝජකයින් රටතුළට ගෙන්වා ගැනීම සඳහා බදු සහන ලබා දීම
03. ආනයන භාණ්ඩ සඳහා වැඩි මිලක් ගෙවීමට සිදු වීම
04. රජයේ සේවකයන් සඳහා පඩි වැඩි කිරීම.

04. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කළ යුත්තේ,
01. ආරම්භක ප්‍රාග්ධනය රු. 1,000ට වැඩි නම් ය.
02. ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් බවට පත්කිරීමේ දී ය.
03. ව්‍යාපාරයේ වගකීම අසීමිත වන නිසා ය.
04. අයිතිකරුගේ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසා ය.

05. වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි වන්නේ පහත සඳහන් කවර රේඛණ සහිත චෙක්පත ද?
01. 

02. 
03. 

04. 


06. ටෙලි බැංකු සේවා ලෙස හඳුන්වන්නේ,
01. දුරකථන බැංකු සේවා පහසුකම් ලබා දීම.
02. පරිගණක බැංකු සේවා පහසුකම් ලබා දීම.
03. අන්තර්ජාල බැංකු සේවා පහසුකම් ලබා දීම.
04. ATM යන්ත්‍ර බැංකු සේවා පහසුකම් ලබා දීම.

07. බැංකුවක් විසින් ගනුදෙනුකරුවෙකුට ණය පදනමක් මත නිකුත් කරන විද්‍යුත් මුදල් කාඩ්පත වන්නේ,
01. හර කාඩ්පත
02. බැර කාඩ්පත
03. ණය කාඩ්පත
04. ATM කාඩ්පත

08. සීමිත පොදු සමාගමක සාමාන්‍ය කොටස් මිලදී ගන්නෙකුට ලැබිය හැකි ප්‍රතිලාභ වන්නේ,
01. ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ
02. පොලී හා ලාභාංශ
03. ප්‍රාග්ධන ලාභ හා පොලී
04. ප්‍රසාද කොටස් හා පොලී

09. කාර්යක්ෂමතාව යනු,
01. ව්‍යාපාරික අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීම.
02. අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිත කිරීම.
03. ආර්ථික හා සාමාජ සංවර්ධනය සඳහා සම්පත් භාවිත කිරීම
04. ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්පත් ලබා ගැනීම හා ඒවා යොදා ගැනීම

10. සැලසුම්කරණයට අයත් කාර්යයක් නොවන්නේ,
01. අරමුණු තීරණය කිරීම. 02. තනතුරු හා වැඩ බෙදා හැරීම
03. ප්‍රතිපත්ති සකස් කිරීම. 04. සම්පත් ලබා ගන්නා ආකාරය තීරණය කිරීම.

11. පහත දැක්වෙන්නේ සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි ක්‍රම කිහිපයකි.
A - දුරකථන සංවාද B - පුවත්පත් C - රැස්වීම් D - සීනුව
ඉහත මාධ්‍යය අතුරෙන් ඔබ පාසලේ භාවිත කරන වාචික සන්නිවේදන ක්‍රම වන්නේ,
01. A හා B 02. B හා C 03. C හා D 04. A හා C

12. මහමාර්ග ප්‍රවාහන මාධ්‍යයකට වඩා දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ වාසියක් වන්නේ,
01. අවශ්‍ය ඕනෑම අවස්ථාවක භාවිත කළ හැකි වීම. 02. නියමිත කාල සටහනකට ධාවනය කිරීම.
03. මාර්ග තදබදයක් නොමැති වීම. 04. තමාට අවශ්‍ය ස්ථානයකට ගමන් කළ හැකි වීම.

13. සිල්ලර වෙළෙන්දෙක්, පාලන මිලට පවතින භාණ්ඩයක් වැඩි මිලක් යටතේ අලෙවි කරයි නම් ඒ පිළිබඳ පැමිණිල්ලක් යොමු කළ හැකි ආයතනය වන්නේ,
01. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයට 02. ශ්‍රී ලංකා පොලීසියට
03. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 04. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට

14. රු. ලක්ෂ 20ක් වටිනා තම මෝටර් රථය සාගර රු. ලක්ෂ 15කට රක්ෂණය කරන ලදි. හදිසි අනතුරක් නිසා මොටර් රථය භාවිතයට ගත නොහැකි තත්වයට පත් විය. සාගර ට රක්ෂණ ආයතනය වන්දි වශයෙන් ලබා දෙන මුදල කොපමණ ද ?
01. රු. ලක්ෂ 15 යි. 02. රු. ලක්ෂ 20යි. 03. රු. ලක්ෂ 35යි 04. රු. ලක්ෂ 5යි.

15. වීරසිංහ තම ජීවිතය රු. 300,000 ක වටිනාකම සී/ස ජනශක්ති රක්ෂණ සමාගමේ රක්ෂණ කර ඇත. ඔහු දැඩි හදවත් රෝගයකින් පෙළීම නිසා කාලයක් තිස්සේ ප්‍රතිකාර ලබා ගත්ත ද ඒ බවක් රක්ෂණ සමාගමට අනාවරණය නොකරන ලදි. හදිසියේ ම වීරසිංහ මරණයට පත් වූ අතර ඊට හේතු ලෙස අනාවරණය වූයේ ඔහුගේ හදවත් රෝගය මූලික වූ බවය. වීරසිංහ විසින් නම් කර තිබූ ඔහුගේ භාර්යාව රක්ෂණ වන්දි ලබා ගැනීමට ඉදිරිපත් වුව ද වන්දි ගෙවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කරන ලදි. මෙම ප්‍රතික්ෂේප කිරීමට අදාළ රක්ෂණ මූලධර්මය වන්නේ,
01. රක්ෂ්‍ය හිමිකම 02. උපරිම විශ්වාසය 03. හානිපූරණය 04. අදාළ බව

16. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලබන්නේ,
01. ශ්‍රී ලංකා මහ බැංකුව 02. ලංකා බැංකුව
03. කොළඹ කොටස් වෙළෙඳ පොල 04. ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

17. සුරංග සීමිත පොදු සමාගම එකක් රු. 10ක් වූ කොටස් 1,000ක් මිලදී ගත්තේ ය. 2021 වර්ෂය සඳහා ඔහුට සමාගම රු. 1,000ක් ලාභාංශ වශයෙන් ගෙවා ඇත. පසුව ඔහු තමා සතු කොටස් සියල්ල එකක් රු. 12 බැගින් විකුණුවේ නම් සුරංගට කොටස් ගනුදෙනුවෙන් ලැබුණු මුළු ප්‍රතිලාභය වන්නේ,
01. රු. 3,000 02. රු. 12,000 03. රු. 13,000 04. රු. 2,000

18. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ප්‍රධානතම සාධක වන්නේ,
01. ආරක්ෂාව හා අවදානම 02. පහසුව හා ප්‍රතිලාභය
03. අවදානම හා ප්‍රතිලාභය 04. අවදානම හා ඇප සුරකුම්

19. වාණිජ බැංකුවක් ජංගම ගිණුම් හිමියෙකුට ජංගම ගිණුම සම්බන්ධයෙන් තොරතුරු දක්වා එවන ලියවිල්ල හඳුන්වන්නේ,
01. බැංකු සැසඳුම ලෙස ය. 02. බැංකු ප්‍රකාශය ලෙස ය.
03. බැංකු අයිරාව ලෙස ය. 04. බැංකු නිවේදන ලිපිය ලෙස ය.

20. මූලික පොත හා එහි ගනුදෙනු සටහන් කිරීමට භාවිත කරන මූලාශ්‍ර ලේඛණය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
01. මුදල් පොත - ඉන්වොයිසි ය. 02. ගැණුම් ජ`නලය - ලදුපත
03. විකුණුම් ජ`නලය - වවුචරය. 04. පොදු ජ`නලය - ජ`නල් වවුචරය

21. ව්‍යාපාරයක් විසින් බඩු තොගයක් රු. 50,000 කට අරලිය සහ සමාගමට විකුණන ලදි. මෙය සටහන් කළ යුතු මූලික පොත වන්නේ,

01. ගැනුම් ජ`නලය 02. විකුණුම් ජ`නලය 03. පොදු ජ`නලය 04. මුදල් පොත.

22. බැංකු සැසදුම් ප්‍රකාශය සකස් කිරීමට භාවිත කරනු ලබන අයිතමයක් වන්නේ,

01. සෘජු ප්‍රේෂණ 02. ස්ථාවර නියෝග ගෙවීම්
03. නිශ්කාෂණය නොවූ චෙක් 04. බැංකු අය කළ ගාස්තු

23. සාගරිකා ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 3,000කි. 2022.01.31 දිනට සුළු මුදල් භාරකරු සතුව රු. 275ක් තිබිණි. 2022.02.01 දින අග්‍රිමය ප්‍රතිපූරණය කිරීමට,

01. සුළු මුදල් පොත හර රු. 3,000, මුදල් පොත බැර රු. 3,000
02. මුදල් පොත හර රු. 3,000, සුළු මුදල් පොත බැර රු. 3,000
03. සුළු මුදල් පොත හර රු. 2,725, මුදල් පොත බැර රු. 2,725
04. මුදල් පොත හර රු. 2,725, සුළු මුදල් පොත බැර රු. 2,725

24. දුන් වට්ටම් රු. 500 ලැබූ වට්ටම් ලෙස සටහන් කර ඇත. එම වරද නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුමට,

01. රු. 500ක් බැර කළ යුතුය. 02. රු. 500ක් හර කළ යුතුය.
03. රු. 1,000ක් හර කළ යුතුය. 04. රු. 1,000ක් බැර කළ යුතුය.

25. බෙදාහැරීමේ වියදම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

01. බොල් ණය, විකුණුම් සේවක වැටුප්, ප්‍රචාරණය. 02. මෝටර් රථ ක්ෂය, බොල් ණය, රක්ෂණය
03. දුන් වට්ටම්, ලැබූ කොමිස්, බොල් ණය 04. බොල් ණය, විදුලි වියදම්, දුන් වට්ටම්

26. මෝටර් රථයක වාර්ෂික ක්ෂය වීම ලෙස රු. 18,000ක් ලාභාලාභ ප්‍රකාශනය හර කර ඇත. එම මෝටර් රථයේ සුන්බුන් අගය රු. 50,000ක් ලෙස ද, ඵලදායි ජීව කාලය වසර 10ක් ලෙසද ඇස්තමේන්තු කර සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි. මෙම මෝටර් රථයේ වටිනාකම කොපමණද ?

01. රු. 68,000 02. රු. 230,000 03. රු. 180,000 04. රු. 50,000

27. සමිති සංවිධාන වල මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා සකස් කරන ගිණුම වන්නේ,

01. ලැබීම් හා ගෙවීම් ගිණුම 02. ලාභාලාභ ප්‍රකාශනය
03. ආදායම් ප්‍රකාශණය 04. මූල්‍ය තත්ව ප්‍රකාශනය

❖ සරසවි යෞවන සමාජයේ සාමාජික සංඛ්‍යාව 120කි. එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 20කි. සාමාජිකයින් 15ක් 2021 වර්ෂය අවසන් වන විට ද සාමාජික ගාස්තු ගෙවා නොතිබුණි.

ඉහත තොරතුරු ඇසුරෙන් අංක 27 හා 28 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

28. 2021 වර්ෂයේ ලද මුළු සාමාජික මුදල කොපමණද ?

01. රු. 2,400 02. රු. 25,200 03. රු. 28,800 04. රු. 2,100

29. 2021 ආදායම් ප්‍රකාශණයට ඇතුළත් කළ යුතු සාමාජික මුදල කොපමණ ද?

01. රු. 2,400 02. රු. 3,600 03. රු. 25,200 04. රු. 28,800

❖ අල්මාරි නිෂ්පාදනය කරන ආයතනයක් සතියක් තුළ දරන ලද වියදම් පහත දැක්වේ.

| | |
|---|---|
| දැව | රු. 40,000 |
| වඩු කාර්මික වැටුප් | රු. 18,000 |
| පොලිෂ්, ඇණ, බුරුසු | රු. 4,000 |
| විදුලි වියදම් | රු. 3,200 |
| ගොඩනැගිලි කුලි | රු. 8,000 |
| යන්ත්‍ර ක්ෂය | රු. 1,800 |

ඉහත තොරතුරු ඇසුරෙන් අංක 30 සිට 32 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

30. ආයතනය අල්මාරි සෑදීම සඳහා දරන ලද ප්‍රාථමික පිරිවැය කොපමණ ද ?

01. රු. 58,000 02. රු. 62,000 03. රු. 59,800 04. රු. 40,000

31. ඉහත ආයතනය සතිය තුළ අල්මාරි 10ක් නිෂ්පාදනය කළේ නම් එක් අල්මාරියක පිරිවැය කොපමණ ද?

01. රු. 6,200 02. රු. 8,000 03. රු. 5,800 04. රු. 7,500

32. ඒකකයක ලාභාංතිකය 30%ක් ලෙස තීරණය කළේ නම් එක් අල්මාරියක විකුණුම් මිල කොපමණ ද?

01. රු. 9,240 02. රු 9,360 03. රු. 9,750 04. රු. 9,900

❖ පහත සඳහන් තොරතුරු උපයෝගි කරගෙන අංක 33 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පබසරගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2021.01.01 තොගය | 12,000 | |
| ගැණුම් | 35,000 | |
| විකුණුම් | | 85,000 |
| 10% බැංකු ණය (වර්ෂ 05) | | 50,000 |
| ලද කොමිස් | | 2,500 |
| ණයගැතියෝ | 10,000 | |
| ණයහිමියෝ | | 8,500 |
| ලද වට්ටම් | | 1,000 |
| රක්ෂණ ගාස්තු | 2,500 | |
| ගෙනඒමේ කුලි | 2,000 | |
| ලී බඩු | 12,000 | |
| මෝටර් රථ | 80,000 | |
| විකුණුම් සේවක වැටුප් | 15,000 | |
| විදුලිය | 3,500 | |
| ගැනිලි | 2,000 | |
| බැංකු ශේෂය | 22,000 | |
| බැංකු පොලී | 4,000 | |
| අතැති මුදල් | 20,000 | |
| ප්‍රාග්ධනය | | 73,000 |
| | 220,000 | 220,000 |

**අමතර තොරතුරු :**

❖ 2021.12.31 දිනට ඉතිරි බඩු තොගය රු. 9,000
❖ ගෙවිය යුතු විදුලිය ගාස්තු රු. 1,500
❖ මෝටර් රථ හා ලී බඩු 10% බැගින් වාර්ෂිකව ක්ෂය කරන්න.
❖ ණයගැතියන්ගෙන් 5% බොල් ණය වෙන් කරන්න.

33. පබසරගේ ව්‍යාපාරයේ 2021 වර්ෂයේ විකුණුම් පිරිවැය වන්නේ,
01. රු. 38,000 02. රු. 40,000 03. රු. 49,000 04. රු. 58,000

34. මෙම ව්‍යාපාරයෙ 2021 වර්ෂයේ දළ ලාභය වන්නේ,
01.රු. 49,000 02.රු. 43,000 03. රු. 45,000 04. රු. 54,000

35. වර්ෂයේ ලාභාලාභ ප්‍රකාශනයේ බෙදාහැරීමේ වියදම් වල එකතුව කොපමණ ද?
01. රු. 23,500 02. රු. 23,000 03. රු. 15,500 04. රු. 15,000

36. ව්‍යාපාරය පිළියෙළ කළ ලාභාලාභ ප්‍රකාශනයේ බැංකු පොලිය ලෙස දැක්විය යුත්තේ,
01.රු. 5,000 02.රු. 4,000 03. රු. 1,000 04. රු. 50,000

37. ව්‍යාපාරය පිළියෙල කළ ලාභාලාභ ප්‍රකාශනයේ පරිපාලන වියදම් යටතේ දැක්වෙන වියදම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
01.බැංකු පොලී, විදුලි ගාස්තු, රක්ෂණ ගාස්තු 02. බොල් ණය, මෝටර් රථ ක්ෂය, විදුලිය ගාස්තු
03.මෝටර් රථ ක්ෂය, ලී බඩු ක්ෂය, විදුලිය ගාස්තු 04. රක්ෂණ ගාස්තු, ලී බඩු ක්ෂය, විදුලිය ගාස්තු

38. 2021.12.31 දිනට පිළියෙළ කරන මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් වල මුළු ධාරණ අගය වන්නේ,
01.රු. 92,000 02.රු. 72,800 03. රු. 82,800 04. රු. 101,200

39. ව්‍යාපාරය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීමක් ලෙස දක්වන්නේ,
01.ගැනිලි 02. ගෙවිය යුතු විදුලිය ගාස්තු
03.ප්‍රාග්ධනය 04. බැංකු ණය

40. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්වෙන ජංගම වගකීම් වල වටිනාකම වන්නේ,
01.රු. 11,500 02.රු. 11,000 03. රු. 10,000 04. රු. 10,500

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.